3 ව්‍යාපාර සංවිධාන

හැඳින්වීම



මිනිසාට සිය ජීවිතය පවත්වා ගෙන යාමේ දී අවශ්‍යතාත් වුවමනාත් සපුරාගැනීමට සිදු වේ. තමාට අවශ්‍ය දෑ තමා ම නිපදවා ගැනීම අතීතයේ දී සිදු විය. එහෙත් වර්තමානයේ දී සිදුවන්නේ අවශ්‍යතා ද වුවමනා ද සපුරා ලන භාණ්ඩත් සේවාත් වෙළෙඳ පොළෙන් මිලට ගැනීම ය. ඒ නිසා වෙළෙඳ පොළට භාණ්ඩත් සේවාත් සැපයීම සඳහා විවිධ ආකාරයේ ව්‍යාපාර සංවිධාන බිහි විය.

අවශ්‍යතාත් වුවමනාත් සපුරා ලීම සඳහා අවශ්‍ය භාණ්ඩ ද සේවා ද සැපයීමට පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ ඒකරාශි වීම ව්‍යාපාර සංවිධානයක් ලෙස හැඳින්වේ.

විවිධ පාර්ශ්ව ව්‍යාපාර සඳහා සම්පත් යොදවයි. සම්පත් යොදවන්නෝ ව්‍යාපාරයේ හිමිකරුවෝ ය. මේ හිමිකාරිත්වය පදනම් කර ගෙන ව්‍යාපාර පෞද්ගලික අංශයත් රාජ්‍ය අංශයත් ලෙස වර්ග කැරේ.

මේ වර්ගීකරණය යටතේ පෞද්ගලික අංශයේත් රාජ්‍ය අංශයේත් ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් හඳුනා ගත හැකි ය. ඒවා අතුරින් ව්‍යාපාර අදහසට ගැළපෙන සංවිධාන වර්ගයක් තෝරා ගැනීමේ දී කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

හඳුනා ගත් ව්‍යාපාර කටයුතු කුමන සංවිධාන ක්‍රමයකට අනුව පවත්වා ගෙන යා යුතු ද යන්න පිළිබඳ ව මේ පරිච්ඡේදයෙන් විමසා බැලේ.

හිමිකාරිත්ව පදනම මත ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

ව්‍යාපාරවලට අරමුදල් යොදවමින් ඒවාට සෘජු ලෙස සම්බන්ධ වන්නෝ එහි හිමිකරුවෝ ය. ව්‍යාපාරය පිළිබඳ අවදානම් දරන්නෝත් ලාභ පාඩු භුක්ති විඳින්නෝත් මෙකී හිමිකරුවෝ ම වෙති. හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන පහත දැක්වෙන අයුරින් වර්ග කළ හැකි ය.



ගැලීම් සටහන අංක 01

ඉහත වර්ගීකරණය අනුව පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන පිළිබඳ ව පළමු ව සලකා බලමු.

පෞද්ගලික අංශයේ ව්‍යාපාර

අයිතිය පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ සතු වන ව්‍යාපාර පෞද්ගලික අංශයේ ව්‍යාපාර වේ.

මේ ව්‍යාපාරවලින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු විවිධ ය. ඒවායින් ප්‍රධාන අරමුණ ලාභ ලැබීම යි. ලාභ ඉපැයීමේ අපේක්ෂාවෙන් තොර ව සමාජයීය ශුභ සාධනය ඇති කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන සංවිධාන ද දැකිය හැකි ය.

පෞද්ගලික අංශයේ ව්‍යාපාර එක් පුද්ගලයකුට අයිති කුඩා ප්‍රමාණයේ ව්‍යාපාරවල සිට අයිතිකරුවන් විශාල පිරිසක් සහභාගි වන මහා පරිමාණ ව්‍යාපාර අවස්ථා තෙක්

ව්‍යාප්ත ව පවතී. ක්‍රියාත්මක වීමේ දී මේ ව්‍යාපාර සංවිධාන එකිනෙකට වෙනස් ය. මේ වෙනස්කම් හඳුනා ගැනීම සඳහා ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ ව මී ළඟට සලකා බලමු.

කේවල ස්වාමි ව්‍යාපාර

අයිතිය එක් පුද්ගලයකුට සීමා වන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර වශයෙන් හැඳින්වේ.

කේවල ස්වාමි ව්‍යාපාර ලොව සෑම රටක ම බහුල ව පවතින ව්‍යාපාර සංවිධාන වර්ගය වේ. ආරම්භ කිරීමේ පහසුව, කුඩා ප්‍රාග්ධනයක් ප්‍රමාණවත් වීම, පවුලේ ශ්‍රමය යොදා ගත හැකි වීම යන ආදි හේතු මේවායේ ව්‍යාප්තියට බලපා ඇත. සිල්ලර වෙළෙඳසල් ආපන ශාලා, බාබර් සාප්පු යන මේවා කේවල ස්වාමි ව්‍යාපාරවලට නිදසුන් වේ.

3.1 රූප සටහන

හවුල් ව්‍යාපාර

ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක් පොදුවේ කර ගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයක් ලෙස හැඳින්වේ.

පුද්ගලයන් දෙදෙනකු හෝ වැඩි පිරිසක් හෝ එක් වී ඇඟවීමෙන් හෝ වාචිකව හෝ ලිඛිතව හෝ හවුල් ව්‍යාපාරයක් ඇති කර ගත හැකි ය. එහෙත් ලිඛිත ව හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම වඩාත් යෝග්‍ය වේ. 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත අනුව රු 1000/ ට වැඩි ප්‍රාග්ධනයක් යොදා ආරම්භ කරන ව්‍යාපාර පවත්වා ගෙන යා හැක්කේ ලිඛිත ගිවිසුමක් යටතේ ය.

සීමාසහිත සමාගම්

පුද්ගලයන් දෙදෙනකු හෝ එයට වැඩි පිරිසක් හෝ එක් වී ලාභ ලැබීමේ පරමාර්ථයෙන් පවත්වා ගෙන යන ව්‍යාපාරයක් සමාගමක් ලෙස හැඳින්වේ. භාණ්ඩාගාරයේ ලේකම් කොටස්කරුවකු වන විට එක් කොටස්කරුවකුට වුව ද සීමිත පොදු සමාගමක් ඇරඹිය හැකි ය. 2007 අංක 07 දරන සමාගම් පනත අනුව සමාගම් වර්ග කිහිපයක් හඳුනා ගත හැකි ය. ඒ සමාගම් වර්ග ගැලීම් සටහනක් මඟින් දැක්විය හැකි ය.

සමාගම් වර්ගීකරණය



ගැලීම් සටහන අංක 02

සමුපකාර සංවිධාන

පුද්ගලයන් සමූහයක් මුදල් යොදවා තම ආර්ථික ශක්තිය උසස් කර ගැනීම සඳහා ස්වෙච්ඡාවෙන් ඇති කර ගන්නා සංවිධාන සමුපකාර නමින් හැඳින්වේ.

අවම වශයෙන් සාමාජිකයන් දස දෙනකුගේ සහභාගිත්වයෙන් සමුපකාර සංවිධානයක් ආරම්භ කළ හැකි අතර සාමාජික අරමුදලින් ප්‍රාග්ධනය සැපයීම සිදු කැරේ.

ඉහත සඳහන් ව්‍යාපාර සංවිධානවලට අදාළ ප්‍රධාන ලක්ෂණ කිහිපයකි. ඒවා පිළිබඳ කෙටි හැඳින්වීමක් පහත දැක්වේ.

ලියා පදිංචිය

ව්‍යාපාරයක් ආරම්භ කළ බවට කිසියම් ආයතනයකින් ලැබෙන පිළිගැනීම ලියා පදිංචිය ලෙස හැඳින්වේ.

ව්‍යාපාර ලියා පදිංචි කිරීමේ දී ඒවාට නෛතික තත්ත්වයක් හිමි වේ. ඇතැම් ව්‍යාපාර ලියාපදිංචි කිරීම සඳහා නෛතික අවශ්‍යතාවක් නැත. එසේ වුව ද විවිධ ප්‍රායෝගික අවශ්‍යතා ඉටු කර ගැනීම පිණිස ව්‍යාපාර ලියාපදිංචි කිරීම වැදගත් වේ.

නෛතික පුද්ගලභාවය

නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පෙනී සිටීමට ව්‍යාපාර ආයතනයකට ඇති හැකියාව නෛතික පුද්ගලභාවය යන්නෙන් අදහස් කැරේ.

කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවලට ව්‍යාපාරයේ නමින් නීතිය ඉදිරියේ පෙනී සිටිය නො හැකි ය. සීමිත සමාගම් හා සමුපකාර සංවිධාන නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනේ.

වගකීම

ව්‍යාපාරයක් බාහිර පාර්ශ්ව වෙත ගෙවීමට ඇති බැඳීම වගකීම් ලෙස සැලකේ.

කේවල ස්වාමි ව්‍යාපාරවලත් හවුල් ව්‍යාපාරවලත් වගකීම අසීමිත බැවින් ව්‍යාපාරය බුන්වත් වුව හොත් බාහිර ණය පියවීම සඳහා අයිතිකරුවන්ගේ පෞද්ගලික දේපොළ පවා කැප කිරීමට සිදු වේ. සීමාසහිත සමාගම්වලත් සමුපකාර සංවිධානවලත් වගකීම සීමාසහිත ය. එනම් කොටස් හිමියන්ගේ වගකීම ඔවුන් යෙදූ ප්‍රාග්ධනයේ නාමික අගයට පමණක් සීමා වේ.

කළමනාකරණය

අරමුණු ඉටු කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂම ව හා සඵලදායි ලෙස යොදා ගැනීම කළමනාකරණය යි.

තනි ව්‍යාපාරයක කළමනාකරණය අයිතිකරු විසින් ද හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් විසින් ද සිදු කරයි. සමාගමක මෙන් ම සමුපකාර සංවිධානවල ද කළමනාකරණ කටයුතු සිදු කරන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි.

ලාභ අලාභ

ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය තුළින් ඇති වන ප්‍රතිඵලය ලාභ අලාභ ලෙස දැක්වේ.

කේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකරුවා ද හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ ද ලාභ ද අලාභ ද භුක්ති විඳිති. සමාගමක කොටස්කරුවනට ලාභාංශ හිමි වේ.

ගිණුම්තැබීම හා විගණනය

"ව්‍යාපාරික ගනුදෙනු පිළිබඳ තොරතුරු වාර්තාගත කිරීම ගිණුම්කරණය" යි.

"වාර්තාගත කරන තොරතුරුවල නිවැරැදි භාවය පරීක්ෂා කර බැලීම විගණනය" යි.

කේවල ස්වාමි ව්‍යාපාරවලත් හවුල් ව්‍යාපාරවලත් ගිණුම් තැබීම ද විගණනය ද අනිවාර්ය නොවේ. එහෙත් ව්‍යාපාරයේ අභිවෘද්ධිය සඳහා ද රජයට කළ යුතු යම් යම් ගෙවීම් නිශ්චය කිරීම සඳහා ද ගිණුම් තැබීම වැදගත් වේ. සීමාසහිත සමාගම් ද සමුපකාර සංවිධාන ද සඳහා ගිණුම් තැබීමත් විගණනයත් අනිවාර්ය වේ.

පැවැත්ම / අඛණ්ඩතාව

දිගු කාලයක් ව්‍යාපාරය ක්‍රියාත්මක වීම පැවැත්ම ලෙස හැඳින්වේ.

කේවල ස්වාමි ව්‍යාපාරවල ද හවුල් ව්‍යාපාරවල ද පැවැත්ම ස්ථිර නැත. අයිතිකරුවන් හා සම්බන්ධ පෞද්ගලික හේතු මත ව්‍යාපාරය වැසී යා හැකි ය. අයිතිකරුගේ අභාවය, රෝගී බව, වස්තු භංගත්වය යන මේවා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. එහෙත් සමාගම්වල ද සමුපකාර සංවිධානවල ද පැවැත්ම සාපේක්ෂ වශයෙන් ස්ථාවර වේ. කොටස්කරුවන්ගේ වෙනස් වීම එහි පැවැත්මට බාධාවක් නොවේ.

ඉහත සඳහන් කරන ලද ව්‍යාපාර සංවිධානවල මූලික ලක්ෂණ වගුවක් ඇසුරෙන් දැක්විය හැකි ය.

ව්‍යාපාරවල මූලික ලක්ෂණ

ව්‍යාපාර සංවිධාන වර්ගය	අයිතිය	ප්‍රාග්ධනය	ලියා පදිංචිය	නෛතික පුද්ගලභාවය	වගකීම	කළමනාකරණය	ලාභ අලාභ	ගිණුම්තැබීම හා විගණනය	පැවැත්ම
කේවල ස්වාමි ව්‍යාපාරය	ප්‍රාග්ධනය සැපයූ පුද්ගලයා සතු වීම.	අයිතිකරු විසින් ඉතිරි කර ගත් මුදල පවුලේ සාමාජිකයන්ගෙන් ලැබූ මුදල් ණය ගැනීම් යන ආදියෙන් සපයා ගැනේ.	අනිවාර්ය නොවේ.	නෛතික පුද්ගලභාවයක් නැත.	අසීමිත ය	අයිතිකරු විසිනි	ඉපැයූ ලාභ හෝ අලාභ හෝ අයිතිකරු විඳ දරා ගනියි.	අනිවාර්ය නොවේ.	අඛණ්ඩ පැවැත්මක් නැත.
හවුල් ව්‍යාපාර	හවුල්කරුවන් සතු ය. අවම සංඛ්‍යාව 2කි. උපරිමය 20කි.	හවුල්කරුවෝ අරමුදල් සපයති.	අනිවාර්ය නොවේ.	නෛතික පුද්ගලභාවයක් නැත.	අසීමිත ය	සියලු ම හවුල්කරුවන්ගේ සහභාගිත්වයෙනි.	ලිඛිත ගිවිසුමක් තිබේ නම් එයට අනුකූල වන් ගිවිසුමක් නැත්නම් 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව සම සම වත් බෙදා ගත යුතු ය.	අනිවාර්ය නොවේ.	අඛණ්ඩ පැවැත්මක් නැත.
සීමාසහිත සමාගම්	කොටස් හිමියන් සතු ය.	කොටස් නිකුත් කිරීම මගින් ලබා ගැනේ. විකල්ප මාර්ග ද ඇත.	අනිවාර්ය වේ.	නෛතික පුද්ගලභාවයක් පවති.	සීමාසහිත ය.	අධ්‍යක්ෂ මණ්ඩලයකිනි	අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ ලාභාංශ ප්‍රමාණය ගෙවනු ලැබේ.	අනිවාර්ය වේ.	අඛණ්ඩ පැවැත්මක් ඇත.
සමුපකාර	සමාජිකයින් සතු ය. අවම සංඛ්‍යාව 10කි. උපරිමයට සීමාවක් නැත.	සමාජිකයන් ගෙන් සපයා ගැනේ. විකල්ප මාර්ග ද ඇත	අනිවාර්ය වේ.	නෛතික පුද්ගලභාවයක් පවති.	සීමාසහිත ය.	අධ්‍යක්ෂ මණ්ඩලයකිනි	සාමාජිකයන් සමිතිය සමඟ සිදු කළ ගනුදෙනුවල වටිනාකම මත ලාභ බෙදේ.	අනිවාර්ය වේ.	අඛණ්ඩ පැවැත්මක් ඇත.

රාජ්‍ය අංශයේ ව්‍යාපාර

රජය විසින් ප්‍රාග්ධනය සපයා ඇති ව්‍යාපාර රාජ්‍ය අංශයේ ව්‍යාපාර වේ.

රජය බොහෝ දුරට ව්‍යාපාර කටයුතු සඳහා සහභාගි වන්නේ සමාජ ශුභ සාධනය සඳහා ය. රජයේ ව්‍යාපාර සංවිධානය වන ආකාරය පහත දැක්වේ:

- රාජ්‍ය දෙපාර්තමේන්තු
- රාජ්‍ය සංස්ථා
- රාජ්‍ය අංශයේ සීමාසහිත සමාගම්.

අවිධිමත් සංවිධාන

ව්‍යාපාරික කටයුතු විධිමත් ක්‍රියාවලියකින් තොර ව පවත්වා ගෙන යන ව්‍යාපාර අවිධිමත් සංවිධාන වේ.

පොළියට මුදල් ණයට දෙන පුද්ගලයන්, තාවකාලික පදනම යටතේ භාණ්ඩ විකිණීමේ කටයුතුවල යෙදී සිටින්නන් අවිධිමත් සංවිධානවලට නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

මේ අනුව ව්‍යාපාර කටයුතු විධිමත් සංවිධාන මෙන් ම අවිධිමත් සංවිධාන වශයෙන් ද පවත්වා ගෙන යනු ලැබේ.

ව්‍යාපාර සංවිධාන ක්‍රම ඇගැයීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා බහුල ලෙස භාවිත කැරෙන්නේ තනි ස්වාමි ව්‍යාපාර හෝ හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රම යි. එහෙයින් එකී ව්‍යාපාර සංවිධානවල වාසි ද අවාසි ද හඳුනා ගැනීම වැදගත් වේ. පහත දැක්වෙන වගුවෙන් එහි වාසි ද අවාසි ද දැක්වේ.

කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර ඇගැයීම

ව්‍යාපාරයේ ස්වරූපය	වාසි	අවාසි
කේවල ස්වාමි ව්‍යාපාර	අඩු වියදමින් ආරම්භ කළ හැකි වීම බලපාන නීති රීති බෙහෙවින් අඩු වීම අයිතිකරුට ව්‍යාපාරය ඍජු ව පාලනය කළ හැකි වීම කුඩා ප්‍රාග්ධනයක් වුව ද ප්‍රමාණවත් වීම සියලු ම ලාභ අයිතිකරු සතු වීම.	ප්‍රාග්ධනය තමා ම සපයා ගනී ප්‍රාග්ධන සම්පාදන මාර්ග අඩු වීම අසීමිත වගකීම ගනු ලබන තීරණ ඇතැම් අවස්ථාවල දී අසාර්ථක විය හැකි වීම අයිතිකරුවන්ගේ පෞද්ගලිකත්වය ව්‍යාපාරය කෙරෙහි බලපෑමක් ඇති කිරීම.
හවුල් ව්‍යාපාර	පහසුවෙන් ආරම්භ කළ හැකි වීම අමතර ප්‍රාග්ධනය ලබා ගැනීමේ පහසුව හවුල් කළමනාකරණයක් පැවැතීම අවදානම බෙදී යාම.	වගකීම අසීමිත වීම ක්ෂණික තීරණ ගැනීම අපහසු වීම නෛතික පුද්ගලභාවයක් නොමැති වීම අඛණ්ඩ පැවැත්මක් නොතිබීම.

ක්‍රියාකාරකම්

1. "මිනිස් අවශ්‍යතාත් වුවමනාත් ඉටු කිරීම සඳහා ප්‍රදේශයේ ජනතාව විවිධ ආකාරයට සංවිධාන වී ඇත".

ඔබගේ ප්‍රදේශයේ ජනතාව ඒ අයුරින් සංවිධානය වී ඇති ආකාරය සිතන්න. එකී සංවිධාන විධිමත් ද අවිධිමත් ද යන්න හඳුනා ගෙන නිදසුන් දක්වමින් ලුහුඬු වාර්තාවක් සකස් කරන්න.

2. ඔබගේ එදිනෙදා පාරිභෝගික අවශ්‍යතා සපුරා ලීම සඳහා භාවිතයට ගැනෙන භාණ්ඩ වර්ග 10ක් ද සේවා 10ක් ද නම් කරන්න. ඒ එකිනෙක ඔබට සැපයෙන ව්‍යාපාර සංවිධාන ක්‍රමය නම් කරන්න.

පහත දැක්වෙන ශීර්ෂ යටතේ කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සීමාසහිත සමාගම් අතර පවත්නා සමාන අසමානකම් සැසඳෙන වගුවක් සකස් කරන්න.

ශීර්ෂය	කේවල ස්වාමි ව්‍යාපාර	හවුල් ව්‍යාපාර	සීමාසහිත සමාගම්
1. අයිතිය			
2. ප්‍රාග්ධනය සපයා ගැනීම			
3. වගකීම			
4. කළමනාකරණය			
5. නෛතික පුද්ගලභාවය			
6. පැවැත්ම			

ව්‍යාපාර අදහසට යෝග්‍ය වන ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීම

ව්‍යාපාර අදහස ක්‍රියාත්මක කිරීමේ දී සැලකිල්ලට ගත යුතු සාධක කිහිපයකි. ඉන් ප්‍රධානත ම කරුණ වන්නේ ගැළපෙන ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම ය. මෙසේ තෝරා ගැනීම නිර්ණායක කිහිපයක් මත සිදු කැරේ. එකී නිර්ණායක පහත දැක්වේ:

- ව්‍යාපාරයේ ප්‍රමාණය
- ව්‍යාපාරයේ ස්වභාවය
- නෛතික අවශ්‍යතා
- වගකීම
- කළමනාකරණය/ පාලන තරාතිරම
- අඛණ්ඩතාව / පැවැත්ම
- නෛතික පුද්ගල භාවය
- ප්‍රාග්ධන අවශ්‍යතාව
- ස්වකීය කැමැත්ත.

මේ එකිනෙක නිර්ණායකය පිළිබඳ ව ලුහුඬින් සලකා බලමු.

ව්‍යාපාරයේ ප්‍රමාණය

ප්‍රමාණය යනු ව්‍යාපාරයේ පරිමාව යි.

සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් ව්‍යාපාර සංවිධාන, ප්‍රමාණය අනුව වර්ග කැරේ.

ව්‍යාපාර සංවිධානයක ප්‍රමාණය සාධක කිහිපයක් මත රඳේ. ව්‍යාපාර සපයන භාණ්ඩ ප්‍රමාණය හා සේවා ප්‍රමාණය, නිෂ්පාදනයට අදළ වෙළෙඳ පොළ ප්‍රමාණය, අවශ්‍ය ප්‍රාග්ධන ශක්තිය යන ආදි සාධක වැදගත් වේ. ව්‍යාපාර අදහසට අනුව කුඩා ප්‍රාග්ධනයකින් ව්‍යාපාරය ආරම්භ කැරෙන්නේ නම් කේවල ස්වාමි ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් හෝ වඩා යෝග්‍ය වේ.

ව්‍යාපාරයේ ස්වභාවය

කවර ආකාරයේ ව්‍යාපාරික කාර්යයක නියැලේ ද යන්න ව්‍යාපාරයේ ස්වභාවය ලෙස සැලකේ.

භාණ්ඩ නිෂ්පාදනය, සේවා සැපයීම, වෙළඳ කටයුතුවල නිරත වීම යන ආදි විවිධ ස්වභාව දැකිය හැකි ය. ව්‍යාපාරයේ ස්වභාවය මත එයට ගැළපෙන ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම වැදගත් වේ.

3.2 රූප සටහන

නෛතික අවශ්‍යතා

ව්‍යාපාර ආරම්භ කිරීමේදීත් පවත්වා ගෙන යාමේ දීත් සපුරා ලිය යුතු නීතිමය කටයුතු නෛතික අවශ්‍යතා ලෙස හැඳින්වේ.

රටේ ක්‍රියාත්මක වන පොදු නීතිය යටතේ මෙන් ම ව්‍යාපාර සංවිධානවලට අදළ සියලු ම නීතිමය අවශ්‍යතා සැලකිල්ලට ගෙන ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගත යුතු වේ.

වගකීම

ව්‍යාපාරයට සම්පත් සැපයු පුද්ගලයනට ව්‍යාපාරයේ ඇති බැඳීම් වගකීම් ලෙස හැඳින්වේ.

ඇතැම් ව්‍යාපාරවලට හිමිකරුගෙන් වෙන් වූ නීතිමය පෞද්ගලික තත්ත්වයක් නැත. එකී ව්‍යාපාරවල අයිතිකරු හෝ අයිතිකරුවන් හෝ සම්පත් සැපයූ බාහිර පාර්ශ්වයන්ට අසීමිත ව වගකිව යුතු ය. ව්‍යාපාර අදහස අනුව වගකීම එක් පුද්ගලයකු මත රැඳේ නම් කේවල ස්වාමි ව්‍යාපාරයක් ද වගකීම පුද්ගලයන් කිහිපදෙනකු අතර බෙදී යන්නේ නම් හවුල් ව්‍යාපාරයක් ද තෝරා ගැනීම යෝග්‍ය වේ.

කළමනාකරණය / පාලන තරාතිරම

සම්පත් කාර්යක්ෂම වත් සඵලදායිවත් යොදා ගනිමින් සංවිධානයක අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට කටයුතු කිරීම කළමනාකරණය ලෙස හැඳින්වේ.

තමාට තනි ව ම ව්‍යාපාර කටයුතු මෙහෙය වීමට හැකි නම් කේවල ස්වාමි ව්‍යාපාරය වඩා යෝග්‍ය වේ. අන් අය සමඟ එකතු වී ඒ කටයුතු සඳහා තීරණ ගැනීම කරන්නේ නම් හවුල් ව්‍යාපාර වඩාත් යෝග්‍ය වේ.

අඛණ්ඩතාව/ පැවැත්ම

ව්‍යාපාරයක් දීර්ඝ කාලයක් පවත්වා ගෙන යාමේ හැකියාව අඛණ්ඩතාව ලෙස හැඳින්වේ.

කේවල ස්වාමි ව්‍යාපාරවල හෝ හවුල් ව්‍යාපාරවල හෝ පැවැත්ම කෙරෙහි අයිතිකරුවන්ගේ වෙනස් වීම් බලපායි. එලෙස පුද්ගලයන් මුහුණ දෙන තත්ත්ව මත ව්‍යාපාරයේ පැවැත්ම රඳා පවතී.

නෛතික පුද්ගලභාවය

නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස ව්‍යාපාරයකට පෙනී සිටීමට ඇති හැකියාව නෛතික පුද්ගලභාවය ලෙස හැඳින්වේ.

සමාගමක් ලියා පදිංචි කළ විට එයට නෛතික පුද්ගලභාවයක් හිමිවේ. නෛතික පුද්ගලභාවය අවශ්‍ය කැරෙන ව්‍යාපාර සමාගම් ලෙස ආරම්භ කිරීමට සිදු වේ.

ප්‍රාග්ධන අවශ්‍යතාව

ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය කොතෙක් ද යන්න මෙයින් අදහස් වේ.

ව්‍යාපාර අදහස ක්‍රියාත්මක කිරීමට කුඩා ප්‍රාග්ධන ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ නම් කේවල ස්වාමි ව්‍යාපාර හෝ හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමය හෝ වඩා උචිත වේ.

ස්වකීය කැමැත්ත

කේවල ස්වාමි ව්‍යාපාරවලට තනි ව තීරණ ගෙන ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇතත් හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් තනි තීරණ ගත නො හැකි ය. මේ අනුව යෝග්‍ය සංවිධාන ක්‍රමයක් තෝරා ගත යුතු ය. ඉහත නිර්ණායක පදනම් කර ගනිමින් ව්‍යාපාර අදහසට යෝග්‍ය ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී පහත දැක්වෙන ආකාරයේ පිරික්සුම් ලැයිස්තුවක් භාවිත කළ හැකි ය.

නිර්ණායක	කේවල ස්වාමි ව්‍යාපාර	හවුල් ව්‍යාපාර	සීමාසහිත සමාගම්
1. වෙළෙඳ පොළ කුඩා නම්			
2. ප්‍රාග්ධන අවශ්‍යතාව කුඩා නම්			
3. නීතිමය බලපෑම අඩු නම්			
4. ස්වකීය අභිමතය පරිදි ක්‍රියා කිරීම අවශ්‍ය නම්			
5. වගකීම අසීමිත නම්			
6. අඛණ්ඩ පැවැත්මක් අවශ්‍ය නම්			

සුදුසු සංවිධාන ක්‍රමය (✓) ලකුණින් ද නුසුදුසු සංවිධාන ක්‍රමය (x) ලකුණින් ද සටහන් කරන්න.

මේ පිරික්සුම් ලැයිස්තුවට අදාළ ව වඩාත් යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමය වන්නේ කුමක් ද? යන්න පිළිබඳ ව තීරණ ගත හැකි ය.



ක්‍රියාකාරකම්

(1)

i. ඔබ ප්‍රදේශයේ තිබෙන සම්පත් භාවිත කරමින් ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථාවක් පදනම් කර ගනිමින් ව්‍යාපාර අදහසක් ඉදිරිපත් කරන්න.

ii. ඒ ව්‍යාපාර අදහසට ගැළපෙන ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී තීරණ ගැනීම සඳහා පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන්න.

(2) පහත සඳහන් ලැයිස්තුවට අදාළ හිස් තැන් සම්පූර්ණ කරන්න.

තෝරා ගැනීමේ නිර්ණායක	හේතු වූ කරුණු	යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමය
ව්‍යාපාරයේ ප්‍රමාණය	වෙළෙඳ පොළ කොටස කුඩා වීම කුඩා පරිමාණ ව්‍යාපාරයක් වීම.	කේවල ස්වාමි ව්‍යාපාර
ව්‍යාපාරයේ ස්වභාවය		
නෛතික අවශ්‍යතාව		
වගකීම		
කළමනාකරණය		
අඛණ්ඩතාව		
ප්‍රාග්ධන අවශ්‍යතාව		
ස්වකීය කැමැත්ත		

ව්‍යාපාර සංවිධාන ආරම්භ කිරීමේ දී අනුගමනය කළ යුතු නෛතික පටිපාටිය

ව්‍යාපාර ආරම්භ කිරීම පිළිබඳ නෛතික තත්ත්ව ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට වෙනස් වේ. සමහර ව්‍යාපාර සඳහා නීතිමය තත්ත්ව අඩු අතර සමහර ව්‍යාපාර සඳහා නීතිමය තත්ත්ව වැඩි ය. පහත දැක්වෙන්නේ එක් එක් ව්‍යාපාර සංවිධාන වර්ගය ලියා පදිංචි කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියත් අදාළ ලිපි ලේඛන කටයුතුත් ය.

ව්‍යාපාර සංවිධාන වර්ගය	ලියා පදිංචි කිරීම	ලිපි ලේඛන කටයුතු
1. කේවල ස්වාමි ව්‍යාපාර	ව්‍යාපාරය තම නමින් පවත්වා ගෙන යන්නේ නම් ලියා පදිංචිය අවශ්‍ය නොවේ. එහෙත් වෙනත් ව්‍යාජ නාමයකින් ව්‍යාපාරය පවත්වා ගෙන යන්නේ නම් 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත අනුව පළාත් සභා ප්‍රඥප්තිය යටතේ පළාත් සභාව මගින් ලියා පදිංචි කැරේ. ලියා පදිංචියට අදාළ අයදුම් පත නියමිත ගාස්තුව සමඟ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.	ව්‍යාපාරය ලියා පදිංචි කළ පසු සහතිකයක් නිකුත් කැරේ. මේ සහතිකය ව්‍යාපාරික ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ය.
2. හවුල් ව්‍යාපාර	හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ලියා පදිංචියට ඉහත සඳහන් ක්‍රියා පටිපාටිය බලපායි. මීට අමතර ව හවුල් ගිවිසුම් සම්බන්ධයෙන් 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අදාළ වේ.	**හවුල් ඔප්පුව** මෙය හවුල් ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර කළමනාකරණයටත් ව්‍යාපාර කටයුතුවලටත් අදාළ නීති රීති හා කොන්දේසි ඇතුළත් ලියවිල්ල යි. මෙහි ඇතුළත් කරුණු ප්‍රාග්ධනය යොදවන ආකාරය කළමනාකරණය සිදු වන ආකාරය ලාභාලාභ බෙදා ගන්නා ආකාරය හවුල්කරුවන් බඳවා ගැනීමේ දී හා ඉවත් ව යාමේ දී ක්‍රියා කරන ආකාරය හවුලේ ඇති වන මතභේද නිරාකරණය කරන ආකාරය යන ආදිය දැක් වේ.

ව්‍යාපාර සංවිධාන වර්ගය	ලියා පදිංචි කිරීම	ලිපි ලේඛන කටයුතු
3. සීමාසහිත සමාගම්	සමාගම් පනත අනුව ලියා පදිංචිය අනිවාර්ය වේ. කොළඹ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිය සිදු කැරේ. 2007 අංක 07 දරන සමාගම් පනත අනුව ලියා පදිංචියට අදාළ ලියවිලි සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කැරේ. එක් එක් ආරම්භක කොටස් හිමියා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රයක් සහ පහත දැක්වෙන ලේඛන ද අදාළ වේ. සමාගමේ නම දැනට පවත්නා සමාගමක නමට සාකල්‍යයෙන් ම අනුරූප වන හෝ සමාන නො වන හෝ බව සඳහන් කරමින් වූ ප්‍රකාශයක් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සමාගමේ අභ්‍යන්තර පරිපාලනයට අදාළ නෛතික තත්ත්ව ප්‍රකාශ කැරෙන ලියවිල්ලයි. සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කිරීම පිණිස එක් එක් ආරම්භක අධ්‍යක්ෂවරයාගෙන් ලබා ගත් කැමැත්ත සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීම පිණිස ලේකම්වරයාගෙන් ලබා ගත් කැමැත්ත. මේ ලියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු සමාගම ලියා පදිංචි කළ බවට සහතිකයක් සමාගම් රෙජිස්ට්‍රාර් වරයා විසින් නිකුත් කැරේ.	සමාගම් නම පිළිබඳ ප්‍රකාශය සාංගමික ව්‍යවස්ථාවලිය අධ්‍යක්ෂකවරුන්ගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශය ලේකම්වරයාගේ ලිඛිත කැමැත්ත දක්වන ප්‍රකාශය

ව්‍යාපාර සංවිධාන වර්ගය	ලියා පදිංචි කිරීම	ලිපි ලේඛන කටයුතු
	එය, සංස්ථාපන සහතිකය හෙවත් සම්මුති සහතිකය නමින් හැඳින්වේ. ඉන් පසු සීමිත සමාගම්වලට ව්‍යාපාර කටයුතු ආරම්භ කළ හැකි ය.	
සමුපකාර සමිති	1972 අංක 05 දරන සමුපකාර පනතට අනුව ලියා පදිංචිය අනිවාර්ය වේ. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලියා පදිංචිය සිදු කැරේ. **ලියා පදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි;** ලියා පදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය සමිතියේ අතුරු ව්‍යවස්ථා පිටපත් දෙකක් සමිතිය පිහිටුවීමේ ආර්ථික යෝග්‍යතාව පිළිබඳ වාර්තාවක් සමිතිය ලියා පදිංචි කිරීම සඳහා යෝජනා සම්මත කර ගත් මහා සභා රැස්වීමේ වාර්තාවේ පිටපතක් සමිතියේ මුදල් පරිහරණය පිළිබඳ වාර්තාව සමිතිය පිහිටි ස්ථානයට ළඟා වීමේ ගමන් මාර්ගය දක්වන සිතියමක්.	**සමුපකාර ව්‍යවස්ථාව** ව්‍යවස්ථාව යනු සමිතියක් පිහිටුවා ගැනීමට අපේක්ෂා කරන්නන්ගේ එකඟත්වයෙන් සමිතිය නිසි පරිදි කර ගෙන යාමට අවශ්‍ය නීති රීති ඇතුළත් කරමින් සකස් කරන ලද වාර්තාව යි. මෙයට සාමාජිකයන්ගේ කැමැත්ත අවශ්‍ය ය.

තනි පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීමේ සහතිකයේ ආකෘති පත්‍රය



Southern Provincial Council

Provincial Companies (SP) R 3

Business Names Ordinance (Cap. 149) incorporated by Business Names Statute No. 1 of 1991

තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ සහතිකය
தனிநபரின் வியாபாரப் பதிவுச் சான்றுப் பத்திரம்
CERTIFICATE OF REGISTRATION OF AN INDIVIDUAL BUSINESS

Certificate No. S..........................

do hereby certify that the following statement, made in pursuance of the Business Names Ordinance (Cap. 149) incorporated by Business Name Statute No. 1 of 1991, was registered in the Provincial Register of Business Names for Southern Province Under 3.......... on the .... day of ....200.....

1 The Business Name	
2 The General Nature of the Business	
The Principal Place of the Business	
4 The Date of Commencement of the Business	
5 Any other Business Name or names under which the Business is carried on	
6 Full Name of Owner	
7 If the Owner if known by the any other Name such Name	
8 The Nationality of the Owner	
9 The Usual Residence of the Owner	
10 Name of the Divisional Secretary's Division	
11 The other Business Occupation if any of the Owner	

Office of the Provincial Registrar of Business Names SP Province

Dated at this .... Day of .... 200......

Provincial Register of Business Name - S/Province

ව්‍යාපාර සංවිධානයක් ලියා පදිංචි කිරීමෙන් අත්වන වාසි

- ලියා පදිංචිය තුළින් ව්‍යාපාරයට පිළිගැනීමක් ඇති වීම
- රජයෙන් ලබා දෙන විවිධ ආධාර උපකාර ලබා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වීම
- නිෂ්පාදිත වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ දී ලියා පදිංචි අංකය තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.

ව්‍යාපාර අදහසට යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී විවිධ නිර්ණායක පිළිබඳ අවධානය යොමු කැරේ. තෝරා ගත් ව්‍යාපාර සංවිධාන ක්‍රමය ආරම්භ කර පවත්වා ගෙන යාමේ දී නෛතික ක්‍රියා පටිපාටිය ද අනුගමනය කළ යුතු ය.



සාරාංශය

ව්‍යවසායකයකු විසින් ව්‍යාපාර අදහසක් ඇති කර ගත් විට සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය තෝරා ගැනීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු ය. ශ්‍රී ලංකාව වැනි රටවල පෞද්ගලික අංශය මෙන් ම රාජ්‍ය අංශය ද ව්‍යාපාර කටයුතුවල යෙදේ. පෞද්ගලික අංශය විධිමත් අයුරින් මෙන් ම අවිධිමත් අයුරින් ද ව්‍යාපාර කටයුතු කරයි. මේ නිසා සුදුසුතම ව්‍යාපාර සංවිධාන වර්ගය තෝරා ගැනීම තුළින් ව්‍යාපාර කටයුතු බාධාවකින් තොර ව පවත්වා ගෙන යාමට හැකියාව ලැබෙනු ඇත. මේ අනුව ව්‍යාපාරිකයා තම හැකියාව, වෙළෙඳ පොළ අවශ්‍යතා, රටේ බලපවත්නා නීති රීති යන ආදිය ද සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර සංවිධාන වර්ගය තෝරා ගත හොත් එය ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වයට පමණක් නොව ආර්ථිකයේ සංවර්ධනයට ද සමස්ත සමාජයේ අභිවෘද්ධියට ද හේතු වනු ඇත.

ක්‍රියාකාරකම

(1) i පහත සඳහන් ව්‍යාපාර ලියා පදිංචි කිරීමේ දී යොදා ගනු ලබන ආකෘති පත්‍ර රැස් කරන්න.
- තනි ස්වාමි ව්‍යාපාර
- හවුල් ව්‍යාපාර
- සීමාසහිත සමාගම්.

(ii) මේ ආකෘති පත්‍ර සම්පූර්ණ කර ලිපි ගොනුවක් සකස් කරන්න

(2) පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් හතරකට බෙදන්න. පහත සඳහන් ව්‍යාපාර සංවිධාන සම්බන්ධයෙන් අදාළ පෙළ පොතේ දී ඇති කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.
- හවුල් ව්‍යාපාර
- සීමාසහිත සමාගම්.

ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාව යටතේ අදාළ ව්‍යාපාරය ආරම්භ කිරීමේ ක්‍රියා පටිපාටියත් එයට අදාළ ලිපි ලේඛන කටයුතුත් අළලා වාර්තාවක් සකස් කරන්න.